# වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II පියවර 2

# ඇබෑර්තු

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය, ගුවන් සේවා කර්මාන්තයේ වර්ධනය වන ඉල්ලුම සපුරාලීමට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුළේ පහසුකම් වැඩිදියුණු කිරීම ඉලක්ක කොටගත් වැදගත් සංසිද්ධියක මුල පිරීමකි. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) අතිනවීන හා නූතන පහසුකම්වලින් සමන්විත නව පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයයි. මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම පමණක් නොව, යාන්ත්‍රික, විදුලි හා ජලසම්පාදන, තොරතුරු තාක්‍ෂණය සහ ජපන් ඉංජිනේරුමය උපදේශනය සමග සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් සමග ආශ්‍රිත කර්මාන්තවල සම්පූර්ණ පරාසයම පරිග්‍රහණය කරගනී.**

**ඉහත ව්‍යාපෘතිය සඳහා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 පරිදි සුදුසුකම්ලත්, ක්‍රියාශීලී ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 1. සිවිල් ඉංජිනේරු - තනතුරු 02 යි

**සුදුසුකම් (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස UGC විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම් හෝ ආශ්‍රිත සාමාජිකත්වය.

සමග

අදාළ ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

හෝ

ii. රජයේ දීප ව්‍යාප්ත සේවාවේ III/II හෝ ඉහළ පංතියේ නිලධාරියකු වීම සහ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක්

සමග

III/II පංතියේ තනතුරක අඩුතරමින් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**වැටුප :** PS 4 මට්ටම - රු. 155,000/- සමග රජයේ අනුමත දීමනා.

### 2. ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක - තනතුරු 01 යි

**සුදුසුකම් (පහත i, ii හෝ iii)**

UGC පිළිගත් ප්‍රමාණ සමීක්‍ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්‍ෂණ ආයතනයේ අන්තර්මධ්‍ය විභාගය සමත්වීම.

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස UGC පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම් හෝ ආශ්‍රිත සාමාජිකත්වය.

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා පළපුරුද්ද.

**වැටුප :** PS 5 මට්ටම - රු. 105,000/- සමග රජයේ අනුමත දීමනා

### 3. තාක්ෂණ නිලධාරී - තනතුරු 01 යි

**සුදුසුකම් (පහත i, ii හෝ iii)**

UGC පිළිගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සමග

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 04 ක පළපුරුද්ද.

හෝ

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සමග

ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලාබ තිබීම.

සහ

අවශ්‍ය විශේෂත්ව අවකාශයේ අඩුතරමින් වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

හෝ

ii. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලාබ තිබීම.

සමග

ප්‍රමාණ සමීක්‍ෂණය පිළිබඳ විශේෂත්ව අවකාශයේ අඩුතරමින් වසර 11 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

සහ

iii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සමග

අවශ්‍ය විශේෂත්ව අවකාශයේ අඩුතරමින් වසර 16 ක සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 09 ක පළපුරුද්ද.

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සමග

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 14 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**වැටුප :** PS 6 මට්ටම - රු. 67,000/- සමග රජයේ අනුමත දීමනා

### 4. ගිණුම් සහකාර - තනතුරු 01 යි

**සුදුසුකම් (පහත i හෝ ii)**

i. UGC පිළිගත් ගිණුම්කරණය / මුදල් පිළිබඳ ප්‍රථම උපාධියක්

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

සහ

ii. ICAS/CIMA/ACCA/CMA ආවසරික සහතිකයක් ලබාතිබීම / අන්තර් මධ්‍යම හෝ සමාන තත්ත්වයේ සාමාර්ථයක් ලබාතිබීම.

සමග

ගිණුම්කරණ / මුදල් ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 04 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**වැටුප :** PS 6 මට්ටම - රු. 67,000/- සමග රජයේ අනුමත දීමනා

**වයස :** 1, 2 හා 4 තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 64 ට නොවැඩි විය යුතුය. අංක 3 තනතුර සඳහා වයස අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අමතර පළපුරුද්ද / සුදුසුකම් :**

i. විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද.

ii. අංක 1 සිට 3 දක්වා තනතුරු සඳහා, ඉදිකිරීම් කොන්ත්‍රාත් පාලනය කරනු ලබන නියමයන් හා කොන්දේසි අර්ථ දැක්වීමේ ප්‍රවීණතාවය

iii. පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය.

iv. අංක 1 සිට 3 දක්වා තනතුරු සඳහා (Auto CAD and MS Project) හෝ සමාන නිපුණතාවය සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ.

**පොදු කොන්දේසි :**

සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක, තම වැටුපෙන් 8% කින් හා සේවයා වැටුපෙන් 12% කින් සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% කින්ද දායක වනු ඇත.

**රැකියා නියුක්තියේ කොන්දේසි :**

සාර්ථක කාර්යසාධනයට යටත්ව වාර්ෂිකව නැවත අලුත් කිරීමේ හැකියාව සහිතව එක් වසරක කාලයකට කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනේ.

**රැකියා ස්ථානය :**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ,<br>
ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,<br>
මිනුවන්ගොඩ පාර,<br>
නයිකන්ද, කටුනායක.

**අයදුම්පත් :**

සම්පූර්ණ ජීවදත්ත සමග අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර ඇතුළත් අයදුම්පත්, බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කොට 2024 ජූලි 01 වන දින හෝ ඊට පෙර ලේකම්, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, 30 වන මහල, බටහිර කුළුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ - 01. වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. සහතික පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අංශ ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටිලැයිස්තු ගත කෙරෙන අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවනු ලැබේ.

**ලේකම්,**

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,<br>
30 වන මහල, බටහිර කුළුන,<br>
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,<br>
කොළඹ - 01.**